# බස්නාහිර පළාතේ පළාත් සභාව - සභා රැස්වීම

## 2018 අගෝස්තු මස 07 වන දින පෙ.ව. 9.30 ට

# න්‍යාය පත්‍රය

I. සභාපතිවරයාගේ නිවේදන
II. නොපැමිණසිටීමේ අවසරය පිළිබඳ යෝජනා
III. ලිපිලේඛන පිළිගැන්වීම
IV. කාරක සභා වාර්තා පිළිගැන්වීම.
V. පෙත්සම්
VI. ප්‍රශ්න / අතුරු ප්‍රශ්න

1. ගරු සුනිල් වටගල මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලි බල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් 2018.06.19 වන දින අසන ලද ප්‍රශ්නය, (ප්‍ර/VI/(1)/18/28)

(අ) කොළඹ මහ නගර සභා බල ප්‍රදේශය තුළ මළ නාලිකා වලට අදාළ මධ්‍යස්ථාන **(Pump Station)** කොපමණ තිබේද?

(ආ) උක්ත මධ්‍යස්ථාන පිහිටුවන ලද්දේ කුමන කාල වකවානුවලද?

(ඇ) දැනට කොළඹ මහ නගර සභා බල ප්‍රදේශයේ ජනතාවගෙන් මළාපවහනයට අදාළව බදු මුදලක් අය කරනු ලබන්නේද?

(ඈ) එවැනි බදු මුදලක් අය කිරීමට කොළඹ මහ නගර සභාව විසින් සැලසුම් කර තිබේද?

(ඉ) එම සැලසුම කුමක්ද? යන්න මෙම සභාවට ඉදිරිපත් කළ හැකිද?

2. ගරු සුනිල් වටගල මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලි බල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් 2018.06.19 වන දින අසන ලද ප්‍රශ්නය, (ප්‍ර/VI/(1)/18/29)

(අ) කොළඹ මහ නගර සභා බල ප්‍රදේශය තුළ ජීවත්වන ජනතාවගෙන් කොළඹ මහ නගර සභාව විසින් අය කරනු ලබන බදු වර්ග මොනවාද?

(ආ) එම බදු වර්ග අතරින් එක් එක් බදු වර්ගයට අදාළව පසුගිය වසරේ (2017) එකතු කරන ලද මුදල වෙන වෙනම දක්විය හැකිද? එසේ නම් ප්‍රමාණය කොපමණද?

3. ගරු සුනිල් වටගල මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලි බල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් 2018.06.19 වන දින අසන ලද ප්‍රශ්නය, (ත්‍ර/VI/(1)/18/30)

(අ) කොළඹ මහ නගර සභාවට අයත් නගරාධිපති නිල නිවාසයේ වැසිකිළි පද්ධතියක් අළුත්වැඩියා කිරීමක්, වත්මන් නගරාධිපතිතුමිය පත්වීමෙන් පසුව සිදු කරනු ලැබ ඇත්තේද?

(ආ) එසේ නම් ඊට අදාළ වියදම් ඇස්තමේන්තුව සභාවට ඉදිරිපත් කළ හැකිද?

(ඇ) කරන ලද ප්‍රතිසංස්කරණයට සාපේක්ෂව එම ඇස්තමේන්තුව අධික බව ඔබතුමා පිළිගන්නේද?

4. ගරු උපාලි කොඩිකාර මන්ත්‍රීතුමා විසින් ගරු මාර්ග ප්‍රවාහන සමූපකාර සංවර්ධන හා වෙළඳ නිවාස හා ඉදිකිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන පිළිබඳ අමාත්‍යතුමාගෙන් 2018.07.17 වන දින අසන ලද ප්‍රශ්නය, (ත්‍ර/VI/(1)/18/35)

අ) ප්‍රවාහන අධිකාරියේ MM 1-1 ප්‍රාදේශීය කළමණාකාර තනතුරේ පුරප්පාඩු කොපමණ තිබේද? එම පුරප්පාඩු පවතින්නේ කුමන ස්ථානවලද?

ආ) එම පුරප්පාඩු පවතින්නේ කොපමණ කලක සිටද?

ඇ) දැනට එම පුරප්පාඩු වලට කුමක් සිදු වී ඇතිද?

ඈ) ප්‍රවාහන අධිකාරියේ MM 1-1 ප්‍රාදේශීය කළමණාකාර තනතුරේ වැඩ බලන තනතුරු කීයක් තිබේද?

ඉ) එම තනතුරුවල පත්වීම් ලබා දෙන්නේ කෙසේද?

ඊ) මෙම පත්වීම් ගරු ආණ්ඩුකාරතුමා විසින් අත්හිටුවා ඇති බව ඔබතුමා දන්නෙහිද?

උ) ගරු ආණ්ඩුකාරතුමා විසින් නව සම්මුඛ පරීක්ෂණයක් පවත්වා පත්වීම් ලබාදීමට උපදෙස් ලබා දී ඇති බව දන්නෙහිද? ඒ අනුව එම උපදෙස් ක්‍රියාත්මක නොකරන්නේ මන්ද?

ඌ) මීට පෙර පැවැත්වූ සම්මුඛ පරීක්ෂණය නීති විරෝධී බැවින් එක් පුද්ගලයෙකුට පමණක්, එනම් හෝමාගම ප්‍රාදේශීය කළමණාකරු වානක මහතාට පමණක් එම තනතුර ලබා දුන්නේ කෙසේද?

එ) ගරු ආණ්ඩුකාරතුමාගේ නියෝගය මත එම පත්වීම් නතර නොකරන්නේ කුමන හේතුවක් නිසාද?

5. ගරු සුසිල් කිඳෙල්පිටිය මන්ත්‍රීතුමා විසින් ගරු මාර්ග ප්‍රවාහන සමූපකාර සංවර්ධන හා වෙළඳ නිවාස හා ඉදිකිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන පිළිබඳ අමාත්‍යතුමාගෙන් 2018.07.17 වන දින අසන ලද ප්‍රශ්නය; (ඉ/VI/(1)/18/37)

අ) ඔබතුමා ප්‍රවාහන විෂයභාර අමාත්‍යවරයා ලෙස පත්වීමෙන් පසුව මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියට කොපමණ සේවක පිරිසක් බඳවාගෙන තිබේද?

ආ) එලෙස සිදුකළ බඳවා ගැනීම් කවර තනතුරු සඳහාද?

ඇ) අදාළ පත්වීම් (ස්ථිර, තාවකාලික, කොන්ත්‍රාත්, ආදේශ හෝ වෙනත්) කවර පදනමකින් සිදු කලේද?

ඈ) බඳවාගත් පටිපාටිය පැහැදිලි කල හැකිද?

ඉ) ඇතමුන් නියමිත පඳවා ගැනීමේ පටිපාටිය අනුව සුදුසුකම් සපුරා නැති බව ඔබතුමා පිළිගන්නේද? නොඑසේනම් ඒ මන්ද?

6. ගරු මහින්ද ජයසිංහ මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලි බල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට; (ඉ/VI/(1)/18/38)

අ) වත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වත්තල ප්‍රාදේශීය සභාව මගින් මුදල් වියදම් කර හොරපෙ සිට හීන්කෙන්ද දක්වා දිවෙන මාර්ගයේ පළමු පාලම අලුතින් ඉදිකිරීම සඳහා කොපමණ මුදලක් වෙන් කළේද යන්න ඔබ තුමා සභාවට දන්වන්නෙහිද?

ආ) එකී පාලමේ සැලසුමට අනුව පැති බැම්මේ දිග කොපමණද යන්නත්, සකස් කරන ලද්දේ කොපමණද දිගකින්ද යන්න සභාවට දන්වන්නෙහිද?

ඇ) මේ වන විට එකී ව්‍යාපෘතිය නිම කර අවුරුද්දක් යන්නටත් පෙර පාලම හා දෙපස ඉරි තැලී ඇති බව ඔබ තුමා දන්නෙහිද?

ඈ) මේ වන විට එකී පාලම දෙපස වලවල් හැරී ඇති බැවින් ඒ හරහා ගමන් කිරීමේදී ගැටළු සහගත තත්ත්වයකට පත්ව ඇති බව ඔබ තුමා දන්නෙහිද?

ඉ) එසේ සාර්ථකව එම ව්‍යාපෘතිය නිම නොකිරීම සම්බන්ධයෙන් අදාළ අයට එරෙහිව ගනු ලබන ක්‍රියාමාර්ගය කුමක්ද?

ඊ) නොඑසේ නම් ඒ මන්ද?

7. ගරු මහින්ද ජයසිංහ මන්ත්‍රීතුමා විසින් ගරු මාර්ග ප්‍රවාහන සමූපකාර සංවර්ධන හා වෙළඳ නිවාස හා ඉදිකිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට; (පු/VI/(1)/18/39)

අ) ජා ඇල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ රාගම තේවත්ත කුරුස හංදියේ සිට වල්පොල දෙසට යන මාර්ගයේ මුල් කොටසේ අවිධිමත් කාණු පද්ධතියක් සකස් කර ඇති බව ඔබ තුමා පිළිගන්නෙහිද?

ආ) එකී කොටස සුළු වැස්සකදී පවා පිටාර ගැලීම හේතුවෙන් අවට ප්‍රදේශවාසීන් දැඩි අපහසුතාවයන්ට පත්වන බව ඔබ තුමා පිළිගන්නෙහිද?

ඇ) අවිධිමත් ලෙස එම මාර්ගයේ කාණුව දැමීම සම්බන්ධයෙන් පරීක්ෂණයක් සිදු කරන්නේද?

ඈ) යම් අයථා ක්‍රියාවක් සිදු කර ඇත්නම් අදාළ අයට එරෙහිව ගනු ලබන ක්‍රියාමාර්ගය කුමක්ද යන්න ඔබ තුමා සභාවට දන්වන්නෙහිද?

ඉ) අවට ප්‍රදේශවාසීන් අපහසුතාවට පත්ව ඇති එකී කාණුව නියමිත පරිදි සකස් කිරීම සඳහා ඔබ තුමා ගනු ලබන ක්‍රියාමර්ගය කුමක්ද යන්න සභාවට දන්වන්නෙහිද?

ඊ) නොඑසේ නම් ඒ මන්ද?

8. ගරු කේ.ඩී. අරුණ දීපාල් මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලි බල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට, (පු/VI/(1)/18/40)

අ) බස්නාහිර පළාත සඳහා පළාත් තක්සේරු දෙපාර්තමේන්තුවක් පිහිටුවිය යුතු බවට යෝජනා කරමින් ඉදිරිපත් කරනු ලදුව සභා සම්මත වූ පෞද්ගලික මන්ත්‍රී යෝජනාවට අනුව පළාත් තක්සේරු දෙපාර්තමේන්තුව (බ.ප) පිහිටුවීමට අදාළව මේ වන විට ගෙන ඇති ක්‍රියා මාර්ග කවරේද?

ආ) එකී ක්‍රියාමාර්ග අනුව පළාත් තක්සේරු දෙපාර්තමේන්තුව (බ.ප) පිහිටුවීමට මෙම වර්ෂය අවසානයට පෙර සිදු කිරීමට හැකියාවක් තිබේද?

ඇ) එසේ නොමැත්තේ නම් ඊට හේතු කවරේද?

9. ගරු මහින්ද ජයසිංහ මන්ත්‍රීතුමා විසින් ගරු අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට; (ඉ/VI/(1)/18/41)

අ) බස්නාහිර පළාත් සභාව විසින් චක්‍රලේඛයන්ට අනුව ගුරුවරුන්ගේ වැටුප් හා උසස්වීම් ලබාදීම ආරම්භ කර ඇත්ද යන්න සභාවට දන්වන්නෙහිද?

ආ) චක්‍රලේඛය නිකුත් වී වසර කිහිපයක් ගතවී ඇතත් තවමත් ගුරුවරුන්ගේ උසස්වීම් හා හිඟ වැටුප් ලබාදීම ප්‍රමාද වන්නේ කුමක් නිසාද යන්න ඔබතුමා සභාවට දන්වන්නෙහිද?

ඇ) ගුරුවරුන්ගේ ශ්‍රේණි උසස් කල බවට දන්වා සිටිය ද එහි සඳහන් පරිදි වැටුපවත් හිඟ මුදලවත් නොලැබෙන්නේ කුමක් නිසාද?

ඈ) බස්නාහිර පළාත් සභාව ගුරු වැටුප් සඳහා වෙන් කළ මුදල් වෙනත් ව්‍යාපෘති සඳහා යොදාගෙන ඇත් ද යන්න සභාවට දන්වන්නෙහිද?

ඉ) උසස්වීම් ලබා දී වැටුප් සකස් කළ පසු මෙතෙක් ගුරුවරුන් ලැබූ වැටුපවත් නොලැබීමට හේතුව කුමක්ද යන්න ඔබතුමා සභාවට දන්වන්නෙහිද?

ඊ) මෙම ගැටළුව විසඳීම සඳහා ඔබතුමා ගනු ලබන ක්‍රියාමාර්ගය කුමක්ද? යන්න සභාවට දන්වන්නෙහිද?

උ) නොඑසේ නම් ඒ මන්ද?

10. ගරු රෝස් ප්‍රනාන්දු මන්ත්‍රීතුමිය විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලි බල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට, (ඉ/VI/(1)/18/42)

අ) කටාන ප්‍රා.ලේ. කොට්ඨාශයේ කිඹිගොඩ ග්‍රාමයේ තේක්කගස් ඇල ද හසුවන සේ කොන්ක්‍රීට් කණු යොදා ගොඩනැගිල්ලක් ඉදි කර ඇති බව ඔබතුමා දන්නේද?

ආ) මෙම ස්ථානයේ දිනපතා රාත්‍රියේ තරුණ තරුණියන් සඳහා සංගීත නාද පවත්වා මත් පෙති වර්ග භාවිතයට තරුණ තරුණියන් යොමු කිරීම නිසා ගම්වාසීන් අතර ආරවුලක් හටගෙන ඇති බව ඔබතුමා දන්නෙහිද?

ඇ) මෙම ගොඩනැගිල්ල සඳහා කටුනායක සීදූව නගර සභාවෙන් හෝ වෙනත් වගකිව යුතු ආයතනයකින් අනුමැතියක් ලබා ඉදිකර ඇත්තේද?

ඈ) එසේ නීත්‍යානුකූල අවසරයකින් තොරව පොදු අදාල මාර්ගයක් හසුවන සේ මෙම ගොඩනැගිල්ල ඉදිකර ඇත්නම්, එය කඩා ඉවත් කිරීමට ඔබතුමා පියවර ගන්නේද?

ඉ) නොඑසේ නම් ඒ මන්ද?

11. ගරු රෝස් ප්‍රනාන්දු මන්ත්‍රීතුමිය විසින් ගරු මාර්ග ප්‍රවාහන සමූපකාර සංවර්ධන හා වෙළඳ නිවාස හා ඉදිකිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට;

(ඉ/VI/(1)/18/43)

---

ඇ) කටාන ප්‍රා.ලේ. කොට්ඨාශයේ අංක 67 උඩංගාව ග්‍රාම නිලධාරි වසමේ ග්‍රාම සංවර්ධන සමිතියේ පසුගිය වසර පහක කාලය තුල (2012 සිට 2017 දක්වා) සිදු කල ව්‍යාපෘති වලට අදාලව 5% ගණනේ ලබාගත් කොමිස් මුදල එක් එක් වසර වෙනුවෙන් වෙන් වෙන් වශයෙන් ඉදිරිපත් කරන්නේද?

ආ) මෙම ග්‍රාම නිලධාරි වසමේ ඉහත කී ග්‍රාම සංවර්ධන සමිතියේ 2017 වර්ෂය තෙක් වසර 5 ක් දක්වා වන අයවැය ලේඛණ මෙම සභාවට ඉදිරිපත් කරන්නේද?

ඇ) එකී ග්‍රාම සංවර්ධන සමිතිය වෙනුවෙන් ඉඩමක් මිලට ගැනීම සඳහාරු. ලක්ෂ පහක (රු. 500.000/-) මුදලක් රැස්කර තිබුණේද?

ඈ) එකී ඉඩම මිලදී ගැනීම මේ වන තෙක් සිදුකර නොමැත්තේද?

ඉ) එකී මුදල රඳවාගෙන ඇත්තේ කවුරුන් විසින්ද?

ඊ) එකී ග්‍රාම සංවර්ධන සමිතියේ 2018 වසරේ කරන ලද ව්‍යාපෘති වෙනුවෙන් මෙතෙක් රැස්කර ඇති 5% බැගින් වන කොමිස් මුදල කොපමණද?

## VII. පෞද්ගලික ප්‍රකාශ

## VIII. වරප්‍රසාද කඩවීම් පිළිබඳ ප්‍රකාශ

## IX. අමාත්‍යාංශ නිවේදන / අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ / වරප්‍රසාද කඩවීම් පිළිබඳ පිළිතුරු

## X. ශෝක ප්‍රකාශ යෝජනා

01. බස්නාහිර පළාතේ පළාත් සභාවේ මන්ත්‍රී ගරු අශෝක දයාරත්න මැතිතුමාගේ අභාවය වෙනුවෙන් ඉදිරිපත් කරන ශෝකය පල කිරීමේ යෝජනාවයි:

---

"බස්නාහිර පළාතේ පළාත් සභාවේ හයවන පළාත් සභාවට ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය නියෝජනය කරමින් ගම්පහ පරිපාලන දිස්ත්‍රික්කය සඳහා ගරු මන්ත්‍රීවරයෙකු වශයෙන් තේරී පත්වූ අශෝක දයාරත්න මැතිතුමා විසින් ගරු පළාත් සභා මන්ත්‍රීවරයෙකු වශයෙන් සිව් වසරකට අධික කාලයක් තුළ බස්නාහිර පළාතේ පළාත් සභාවටත් බස්නාහිර පළාතේ ජනතාවටත් ඉටු කරන ලද සේවය අගය කරමින් එතුමාගේ අභාවය පිළිබඳව මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව සාතිශය සංවේගය පළ කර සිටියි."

(ඉදිරිපත් කිරීම - ගරු සභානායකතුමා විසින්)

02. බස්නාහිර පළාතේ පළාත් සභාවේ හිටපු ගරු මන්ත්‍රී නිහාල් ජයවර්ධන මැතිතුමාගේ අභාවය වෙනුවෙන් ඉදිරිපත් කරන ශෝකය පල කිරීමේ යෝජනාවයි:

---

"බස්නාහිර පළාතේ පළාත් සභාවේ තෙවන පළාත් සභාවට පොදුජන එක්සත් පෙරමුණ නියෝජනය කරමින් ද සිව්වන පළාත් සභාවට හා පස්වන පළාත් සභාවට එක්සත් ජනතා නිදහස් සන්ධානය නියෝජනය කරමින්ද ගම්පහ පරිපාලන දිස්ත්‍රික්කය සඳහා ගරු මන්ත්‍රීවරයෙකු වශයෙන් තේරි පත්වූ ගරු නිහාල් ජයවර්ධන මැතිතුමා විසින් ගරු පළාත් සභා මන්ත්‍රීවරයෙකු වශයෙන් වසර පහළොවක පමණ කාලයක් තුල බස්නාහිර පළාතේ පළාත් සභාවටත් බස්නාහිර පළාතේ ජනතාවටත් ඉටු කරන ලද සේවය අගය කරමින් එතුමාගේ අභාවය පිළිබඳව මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව සාතිශය සංවේගය පල කර සිටියි."

(ඉදිරිපත් කිරීම - ගරු සභානායකතුමා විසින්)

## XI. පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ කටයුතු

01. ගරු සුනිල් වටගල මන්ත්‍රීතුමා :

"බ්ලූමැන්ඩල් කුණු කන්ද, මීතොටමුල්ල කුණු කන්ද, කරදියාන කුණු කන්ද, වැනි කුණු කඳු කඩා වැටී මනුෂ්‍ය ජීවිතත්, සමස්ත පරිසරයත් ව්‍යසනයට පත් වෙද්දී ඒවාට වග කියන බලධාරීන්, ආයතන ,ඒවා වැළැක්වීමටත් ,ඒවාට ස්ථිර සාර විසඳුම් යොදන බවත්, කියමින් නොයෙකුත් පුරසාරම් දොඩන ලදී. මීතොටමුල්ල කුණු කන්දත්; බ්ලූ මැන්ඩල් කුණු කන්දත් නාගරික උද්‍යාන බවට පත් කරන බවට ප්‍රකාශ කරන ලදී. තවමත් එම කුණු කඳු එසේම පවතී. දීර්ඝ කාලීන වැඩපිළිවෙලක් නොමැත. කැළණි ගඟ වසරක් පාසා පිටාර ගලද්දී ඒවාට යට වන ජනතාවට එම අවස්ථාවේ දී බත් පැකට්ටුවක්, වියළි ආහාර ටිකක් බෙදා දී තාවකාලිකව සමනය කරනු ඇත. මෙම සියළු ව්‍යසනයන්ට ඒ ඒ විෂයන් අයත් අමාත්‍යාංශ මැදිහත්ව ,දීර්ඝකාලීන විසඳුම් ඉදිරිපත් කළ යුතු යැයි මෙම බස්නාහිර පළාතේ සභාව යෝජනා කර සිටියි."

(යෝ/ VI/(1)/18/04)

02. ගරු උපාලි කොඩිකාර මන්ත්‍රීතුමා :

" බස්නාහිර පළාතේ අධ්‍යාපන කලාප මට්ටමින් පිහිටුවනු ලැබ ඇති විශේෂ අවශ්‍යතා ඇති දරුවන් ඉගෙනුම ලබන පාසල් සංඛ්‍යාව 182 ක් පමණ වන අතර, එම පාසල් වල ඉගෙනුම ලබන විශේෂ අවශ්‍යතා සහිත දරුවන් සංඛ්‍යාව 3713 කි.

රජයේ පාසල් වල ඉගෙනුම ලබන සාමාන්‍ය දරුවන්හට 5 ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගයේ ප්‍රතිඵල මත ශිෂ්‍ය ආධාර මුදලක්ද, විශ්ව විද්‍යාල සිසුන්හට මහපොළ ශිෂ්‍යත්වය මඟින් ශිෂ්‍ය ආධාර මුදලක්ද, ලබා දීමේ ක්‍රමයක් පැවතිය ද විශේෂ අවශ්‍යතා සහිත දරුවන්හට ශිෂ්‍ය ආධාර මුදලක් ලබා දීමේ ක්‍රමවේදයක් නොමැත.

බස්නාහිර පළාතේ විශේෂ අවශ්‍යතා සහිත දරුවන් සඳහා අධ්‍යාපනය ලබා දෙන පාසල් වල ඉගෙනුම ලබන දරුවන් දිරි ගැන්වීම සඳහා එම දරුවන්ගේ අධ්‍යාපන කටයුතු වෙනුවෙන් යම් දීමනාවක් ආධාර මුදලක් ලබා දිය යුතු යැයි මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව අදහස් කර සිටියි. "

(යෝ/ VI/(1)/18/05)

## XII. සභාව කල් තැබීම.

කේ.එච්.ඩී.කේ. සමරකෝන්,
ලේකම්,
බස්නාහිර පළාතේ පළාත් සභාව.

2018.07.18 දින.
සභා ලේකම් කාර්යාලය,
බස්නාහිර පළාතේ පළාත් සභාව,
5 වන මහළ, B පර්යන්තකය,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.